*සැ. යු.* - 2023.06.02 දින පළ කරන ලද අංක 2335 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,336 - 2023 ජුනි මස 09 වැනි සිකුරාදා - 2023.06.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 380 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 382 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 ජුනි මස 30 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජුනි මස 16 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

379- B 082462 — 353 (2023/06)
D I -

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

(ස්වකීය සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

*සහ එහි ශාඛා කාර්යාලය :*

අංක 09, අතුරුගිරිය පාර, මාලබේ.

නඩු අංක : CHC/97/2013/MR
ඇස්කිසි අංක : 12/2023

*..............පැමිණිලිකරු.*

*එදිරිව*

01. ඩයිනග්‍රෝ ප්‍රයිවේට් ලිමිටඩ්,
අංක 549 බී, ඉසුරු උයන,
ඩී. පී. විජේසිංහ මාවතට ඔබ්බෙන්,
තලංගම දකුණ, බත්තරමුල්ල.

02. ටර්බයින් වෙන්ටිලේෂන් සිස්ටම්ස් (ප්‍රයිවේට්) ලිමිටඩ්,
අංක 549බී, ඉසුරු උයන,
ඩී. පී. විජේසිංහ මාවතට ඔබ්බෙන්,
තලංගම දකුණ, බත්තරමුල්ල.

*...........විත්තිකරුවෝ.*

වර්ෂ 2018ක් වූ මැයි මස 16 වැනි දින මෙම නඩුවට ඇතුලත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුමත වී ඇති හෙයින්, එම තීන්දු ප්‍රකාශය අනුව,

**පැමිණිල්ලේ පළමුවන නඩු නිමිත්ත සම්බන්ධයෙන්,**

රුපියල් හතලිස් ලක්ෂ තිස් හත් දහස් දෙසිය හැට පහයි ශත හතලිස් තුනක (රු. 4,037,265.43) ක මුදලක් ද මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් රුපියල් තිස් ලක්ෂයක් (රු. 3,000,000/-) වන මුල් මුදල මත වර්ෂ 2012ක් වූ මාර්තු මස 01 වැනි දින සිට වාර්ෂිකව 29%ක අනුපාතය මත පොළිය ද ගෙවන ලෙස අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

**පැමිණිල්ලේ දෙවන නඩු නිමිත්ත සම්බන්ධයෙන්,**

රුපියල් හතලිස් ලක්ෂ තිස් හත් දහස් දෙසිය හැට පහයි ශත හතලිස් තුනක (රු. 4,037,265.43) ක මුදලක් ද මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් රුපියල් තිස් ලක්ෂයක් (රු. 3,000,000/-) වන මුල් මුදල මත වර්ෂ 2012ක් වූ මාර්තු මස 01 වැනි දින සිට වාර්ෂිකව 29%ක අනුපාතය මත පොළිය ද ගෙවන ලෙස අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

**පැමිණිල්ලේ තුන්වන නඩු නිමිත්ත සම්බන්ධයෙන්,**

රුපියල් තිස්තුන් ලක්ෂ දෙළොස් දහස් හයසිය අසූ හයයි ශත පහළොවක (රු. 3,312,686.15) මුදලක් ද මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් රුපියල් විසිහතර ලක්ෂ හතලිස් නව දහස් හයසිය තිස් නවයයි ශත හතලිස් හතරක (රු. 2,449,639.44) වන මුල් මුදල මත වර්ෂ 2012ක් වූ මාර්තු මස 01 වැනි දින සිට වාර්ෂිකව 29%ක අනුපාතය මත පොළිය ද ගෙවන ලෙස අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

**පැමිණිල්ලේ හතරවන නඩු නිමිත්ත සම්බන්ධයෙන්,**

රුපියල් හතලිස් ලක්ෂ තිස් හත් දහස් දෙසිය හැට පහයි ශත හතලිස් තුනක (රු. 4,037,265.43) ක මුදලක් ද මුලු මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් රුපියල් තිස් ලක්ෂයක් (රු. 3,000,000/-) වන මුල් මුදල මත වර්ෂ 2012ක් වූ මාර්තු මස 01 වැනි දින සිට වාර්ෂිකව 29%ක අනුපාතය මත පොළිය ද ගෙවන ලෙස අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

**පැමිණිල්ලේ පස්වන නඩු නිමිත්ත සම්බන්ධයෙන්,**

රුපියල් හතලිස් ලක්ෂ තිස් හත් දහස් දෙසිය හැට පහයි ශත හතලිස් තුනක (රු. 4,037,265.43) ක මුදලක් ද මුලු මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් රුපියල් තිස් ලක්ෂයක් (රු. 3,000,000/-) වන මුල් මුදල මත වර්ෂ 2012ක් වූ මාර්තු මස 01 වැනි දින සිට වාර්ෂිකව 29%ක අනුපාතය මත පොළිය ද ගෙවන ලෙස අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් මා විසින් වර්ෂ 2023ක් වූ අප්‍රේල් මස 04 වැනි දින තහනමට ගන්නා ලද පහත උපලේඛණයේ සඳහන් නිශ්චල දේපල,

**වර්ෂ 2023ක් වූ අගෝස්තු මස 03 වැනි දින පෙ. ව. 11.00 ට** එම දේපල පිහිටි ඉහත සඳහන් ලිපිනයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ බත්තරමුල්ල-තලංගම ඒකකයේ සීමාව ඇතුළත තලංගම දකුණ පිහිටි මිල්ලගහවත්තෝවිට හෝ අලුබෝගහලන්ද යනුවෙන් හඳුන්වනු ලබන වරිපනම් අංක 549/බී (ඉසුරු උයන) දරන (බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද වර්ෂ 1967ක් වූ අගෝස්තු මස 20 වැනි දිනැති අංක 3625 දරන නැවත බෙදා වෙන් කිරීමක් වන පිඹුරේ ලොට් 13) බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු අයි. ඒ. සී. සේනාරත්න විසින් සාදන ලද වර්ෂ 1989 ක් වූ ජනවාරි මස 20 වැනි දිනැති අංක 3440 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණුකර නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු එම්. බී. ද සිල්වා විසින් සාදන ලද වර්ෂ 1918ක් වූ පෙබරවාරි මස 11 වැනි දිනැති අංක 232 දරන පිඹුරේ ලොට් සී කැබැල්ල ද, නැගෙනහිරට : ඉසුරු උයන වරිපනම් අංක 253/36 දරන පරිශ්‍රය ද, දකුණට : ඉසුරු උයන සහ බස්නාහිරට : එකී අංක 3625 දරන පිඹුරේ ලොට් 14 දරන කැබැල්ල ද වන ඉහත සඳහන් අංක 3440 දරන පිඹුර ප්‍රකාර ව එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු, පස සහ සියලු දේ සමග ප්‍රමාණයෙන් පර්චස් දහනවයකුත් දශම අටයි හතක් (පර්. 19.87) වන හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී. 1171/244 හි ලියාපදිංචි කර ඇති ඉඩම.

අශ්වයන්, හරකුන් හෝ වෙනත් සතුන් ඇතිව හෝ නැතිව මෝටර් කාර්, මෝටර් ලොරි, බර පැටවූ හෝ නොපැටවූ වෙනත් සෑම වර්ගයක ම වාහන ඇති හෝ නැතිව මෙහි විශේෂයෙන් ම විස්තර කරන ලද මාර්ගය තුළ හෝ ඔස්සේ හෝ ඒ මත්තෙන් මින්පසු සදකල්හි ම කවර ස්වභාවයක වුව සියලුම කාරණාවන් සඳහා තමන්ගේ කැමැත්ත සහ අභිලාෂය පරිදි දිවා කාලයෙහි දී හෝ රාත්‍රී කාලයෙහි දී පයින් හෝ වෙනත් ලෙසකින් යාමට ඒමට, පසු කිරීමට, නැවත පසු කිරීමට උකස් දීමනාකරුට ඔහුගේ ආගන්තුකයන්ට, ඉංජිනේරුවන්ට, වාස්තු විද්‍යාඥයන්ට, ශ්‍රමිකයන්ට, සේවකයන්ට, කුලී නිවැසියන්ට, බලපත්‍රලාභීන්ට සහ ආරාධිතයන්ට ආයතනයේ නිර්යාතයේ ප්‍රතික්‍රමණයේ පූර්ණ සහ නිදහස් අයිතිය ස්වාධීනතාව සහ අවසරය ද ඒ සමඟ දරන පාවිච්චි කරනු ලබන, භුක්ති විඳින සියලු සහ ඒ ඒ අයිතීන් මං, වාසි සහ අනුබද්ධයන් ද ඒ මත හෝ උඩින් විදුලි කේබල් සහ උඩින් කම්බි සහ ජලාපවාහන, ගෑස් සහ ජලනල කවර ස්වභාවයක වුව ගෘහ උපකරණ හෝ වෙනත් උපක්‍රම ද යෙදීමේ පූර්ණ සහ නිදහසේ සදාකාලීන අයිතිය සහ ස්වාධීනතාව,

ඉහත කී තලංගම පිහිටි මිල්ලගහවත්තඹිවිට *නොහොත්* අලුබෝගහලන්ද නැමැති එකී ඉඩමට අදාළව බලපත්‍රලත් මිනින්දෝරු සහ තලමිතිකරු වී. ඒ. එල්. සේනාරත්න විසින් පිළියෙල කරන ලද වර්ෂ 1967ක් වූ අගෝස්තු මස 20 වැනි දිනැති සහ අංක 3625 දරන එකී පිඹුරේ අඩි විස්සක පළල මාර්ග රක්ෂිතය වූ ද, එකී පිඹුරේ ආර් 1 වශයෙන් නිරූපිත ඉඩම් කොටස වූ ද, අඩි 20ක් පළල ඉසුරු උයන නමැති මුලු මාර්ගයට මායිම් : උතුරට : 1,6, ආර්. 2,7,8,11 ආර්. 4, 12-17 දරන ඉඩම් කොටස්, නැගෙනහිරට : මාර්ගය, දකුණට : 18 සිට 23 දක්වා ද, 24, ආර්. 3,27,28, 30 සහ 31 දරන ඉඩම් කොටස් ද, බස්නාහිරට : බී දරණ ඉඩම් කොටස සහ ප්‍රමාණයෙන් අංක 3625 දරන එකී පිඹුර ප්‍රකාර ව රූඩ් එකයි, පර්චස් විස්සක් (රූ. 1, පර්. 20) හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1178/191 හි ලියාපදිංචි වූ ද එකී මාර්ගය.

අධිකරණ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

2023ක් වූ මැයි මස 29 වැනි දින දී ය.

06-159

# විවිධ දැන්වීම්

## පෙත්සම පිළිබඳ දැන්වීම

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන ගණන් බේරා වසා දැමීම බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

ගණන් බේරා වසා දැමීමේ අයදුම්පත්
අංක : HC (Civil) 23/2023/CO

අංක 707, රෝහල් පාර, යාපනය හි ASK කේබල් විෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් කාරණාවේ දී ය.

*සහ, තව ද,*

අංක 241/32, තලගහවත්ත පාර, කොළඹ 00500.

*සහ*

2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්ති 270 (e) සහ (f) යටතේ අධිකරණය විසින් ASK කේබල් විෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්.

ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් වූ කාරණාවේ දී ය.
නෙක්ස්ට්වෙන්චර්ස් ලිමිටඩ්,
(Nextventures Limited)
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

*.........................පෙත්සම්කරු.*

(සිය අධිකරණයේ සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම තුළින්) කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා කොළඹ 03, ඩීල් පෙදෙස, අංක 2හි නෙක්ස්ට්වෙන්චර්ස් ලිමිටඩ් (Nextventures Limited) විසින් 2023 මාර්තු මස 21 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම 2023 සැප්තැම්බර් මස 08 වැනි දින විධානය මත අධිකරණය ඉදිරියේ අසා නියෝගයක් කිරීමට, සහයෝගය හෝ විරෝධය දැක්වීමට කැමති එකී සමාගමේ යම් ණය හිමියකු හෝ දයකයකු එකී පෙත්සම විභාග කරන වේලාවේ දී පුද්ගලිකව හෝ නීතිඥ හෝ ලේඛණගත නීතිඥ මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බව මෙයින් දන්වනු ලැබේ. තව ද, පෙත්සමේ පිටපතක් ඒ සඳහා නියම කර ඇති ගාස්තු ගෙවීම මත, එය අවශ්‍ය වන, සමාගමේ යම් ණයහිමියෙකුට හෝ දයකයෙකුට පහත සඳහන් නීතිඥවරුන් විසින් සපයනු ලබන්නේ ය.

නීලකන්ඩන් සහ නීලකන්ඩන්,
නීතිඥවරු සහ ප්‍රසිද්ධ නොතාරිස්වරු (කලින් මුරුගේසු සහ නීලකන්ඩන්),
කන්දයියා නීලකන්ඩන් ගොඩනැගිල්ල (5 වන මහල),
අංක 2, ඩීල් පෙදෙස, කොළඹ 03.

***සටහන.***- එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ පෙනී සිටීමට අදහස් කරන යම් පුද්ගලයෙකු එසේ කිරීමට ඇති ඔහුගේ අදහස ඉහත නම සඳහන් නීතිඥවරුන් වන නීලකන්ඩන් සහ නීලකන්ඩන් මහතුන් වෙත ලිඛිතව භාරදිය යුතුය. *නැතහොත්* තැපැල් මගින් එවිය යුතුය. එසේ එවීමේ පුද්ගලයාගේ නම සහ ලිපිනය හෝ යම් ව්‍යාපාරයක් නම්, එහි නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කළ යුතුය. එය පුද්ගලයා හෝ සමාගම හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛණගත නීතිඥයින් ඇත්නම්, ඔවුන් විසින් හෝ අත්සන් කරනු ලැබිය යුතු අතර, එය **2023 සැප්තැම්බර් 07 වැනි දින පස්වරු එකට (01)** පෙර ඉහත නම සඳහන් අයවලුන්ට ලැබෙන සේ කල් වේලාව ඇතිව භාර කිරීම හෝ තැපැල් කරනුයේ නම් එසේ කිරීමට අවශ්‍ය වේ.

නීලකන්ඩන් සහ නීලකන්ඩන්,
පෙත්සම්කරුගේ නීතිඥයින්.

06-169

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.